# භක්ති ගීත-බු.ව.2549

සිදුහත් කුමරුන් ඉපදුණ වෙසක් පෝයද
සිදුහත් කුමරුන් බුදුවුණ වෙසක් පෝයද
බුදු හිමියන් පිරිනිවි මේ වෙසක් පෝයද
සිරස නමා නමදිමු අපි මේ පුන් පෝද

තිලොවට තිලකවු බුදුහිමි දෙසුවේ සදහම්
තිලොවම බඹ-සුර-නර-සෙන් ඇසුවේ සදහම්
තිලොවම විදු නැණ පහසින් පැතුවේ සදහම්
මොහ'ඳුර දුරු කරනා මඟ පෙන්වූ සදහම්

ඉසි-කෝ-මද-මාන කෙලෙස් හැම දුරුවේවා
ලෝබ-දෝස-මෝහ මූල හැම දුරුවේවා
යහ ගුණ දම් සුරකින සව්සත බිහිවේවා
තෙරුවන් සරණින් ලෝ සතහට සෙතවේවා

කරුණා මෙත් මුදිතා ගුණ දම් සුදිලේවා
මැදහත් සිතුවිලි ලෝ සතතුල සුරැකේවා
ඉවසීමෙන් හද සනසන සැනසුම වේවා
තුන්ලොව සත් වගටම සුවසෙත සැලසේවා

-හිඹුටානේ කල්‍යානි සෙනරත් යාපා-